# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2272/08 – 2022 මාර්තු 21 වැනි සඳුදා – 2022.03.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2018/102.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2019.08.05 දිනැති හා අංක 2135/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.07.24 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් කෑගල්ල, මීපිටිය, අංක 600 හි පදිංචි ආර්. එම්. තනුජ කුමාර රණරාජා මයා, හංවැල්ල, නිරිපොල, කුරුඳුවත්ත, හි පදිංචි එම්. පී. පී. විජේවර්ධන මයා සහ මාතලේ, කයිකාවල, වේරගම පිහිටි ඩයනා ට්‍රේඩින් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.01.02 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 මාර්තු මස 02 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය: IR/ COM/02/2018/102

**කොළඹ කාර්මික අධිකරණයේ දී ය.**

නඩු අංකය: A/76/2019

1. ආර්. එම්. තනුජ කුමාර රණරාජා මයා
අංක 600,
මීපිටිය,
කෑගල්ල.

1A – G 36424 – 10 (2022/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2. එම්. පී. පී. විජේවර්ධන මයා,
කුරුඳුවත්ත,
නිරිපොල,
හංවැල්ල.

*පළමු පාර්ශවය*

*එදිරිව*

ඩයනා ට්‍රේඩින් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්,
වේරගම,
කයිකාවල,
මාතලේ.

*දෙවන පාර්ශවය*

අතර පවතින කාර්මික ආරවුල

**ප්‍රදානය**

කම්කරු හා වෘත්තීය සම්බන්ධතා අමාත්‍ය, ගරු රවින්ද්‍ර සමරවීර මැතිතුමා විසින් 1957 අංක 14 සහ 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39/1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා 2019 ජූලි මස 23 දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ** වනුයේ,

බේරුම්කරණය සඳහා මා වෙත යොමුකර ඇති උක්ත නියෝගය ප්‍රකාරව, ඉහත සඳහන් දෙපාර්ශවය අතර උද්ගතවී ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණය ලෙස කම්කරු කොමසාරිස් ජනරාල් ඒ. විමලවීර මහතා විසින් 2019 ජූලි මස 08 දිනැතිව එවා ඇති ලිපියේ දැක්වෙන්නේ,

'' ඩයනා ට්‍රේඩින් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ සේවය කරන/ කළ ආර්. එම්. තනුජ කුමාර රණරාජ මහතාට සහ එම්. පී. පී. විජේවර්ධන මහතාට පහත සඳහන් දීමනා වන 1. මාසික ස්ථිර දීමනාව, 2. මෝටර් රථ දීමනාව හා 3.ක්ෂේත්‍ර දීමනාව හිමි ද? හිමි නම් එය නොගෙවීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමි විය යුතු සහන මොනවා ද? යන්න පිළිබඳව වේ.''

මෙම යොමුවට අනුව ආරවුලට අදාළ පාර්ශවයන් වෙතින් ලිඛිත කරුණු ලබාගැනීමෙන් අනතුරුව මෙකී නඩුව විභාගයට ගැනීමට තීරණය කරමින් 2019. 12. 18 දින නඩු විභාගය සඳහා දෙපාර්ශවයම කැඳවන ලදී. වග උත්තරකාර පාර්ශවයේ නීතීඥ මහතා සහභාගි නොවූ අතර, කෙසේ වුව ද ඉල්ලුම්කාර පාර්ශවයේ සමථ යෝජනා වග උත්තරකාර පාර්ශවයට භාරදෙන ලදී. 2020.02.03 වන දින නැවත කඳවීම් කල අතර එහිදී සමථයකට එළඹීමට අදාළ කරුණු පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලදී.

එදින ද ඉහත කී ආරවුල සමථයට පත් නොවූ අතර නැවත විභාගයට ගැනීම 2020.02.27 දින සහ 2021.03.04 දිනයන්හි සිදුකළ අතර එහි දී ආරවුලට හේතු වූ කරුණු පිළිබඳව අදාළ ලේඛන හුවමාරු කරගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලදී. 2021. 12. 03 දින නැවත කැඳ වූ අතර, එහිදී දෙපාර්ශවය අතර පහත පරිදි ආරාවුල් සමථයට පත් කරගන්නා ලදී. එනම්,

1. පළමු ඉල්ලුම්කරුවන ආර්. එම්. තනුජ කුමාර රණරාජා මයාට මෙම නඩුවේ සමථයක් ලෙස රුපියල් එක් ලක්ෂ පනස් දහසක් ගෙවමින් ද, (කොමර්ෂල් බැංකුවේ අංක: 929073 සහ 2021.12.01 දිනැති චෙක්පත මඟින්) එකී ඉල්ලුම්කරු විසින් එය භාර ගනිමින්,

2. දෙවන ඉල්ලුම්කරුවන එම්. පී. පී. විජේවර්ධන මයාට මෙම නඩුවේ සමථයක් ලෙස රුපියල් හැත්තෑපන් දහසක් (රු. 75000/-) ගෙවමින් ද , (කොමර්ෂල් බැංකුවේ අංක: 929071 සහ 2021. 12. 01 දිනැති චෙක්පත මඟින්) එකී ඉල්ලුම්කරු එය භාර ගනිමින්, සහ,

3. මේ පිළිබඳව මාතලේ කම්කරු විනිශ්චය සභාවේ අංක: 39/1/2018 යන නඩුව ඉල්ලා අස්කරගැනීමට ද ඉල්ලුම්කරුවන් එකඟතාවය පළ කරමින් ද සමථයට පත්වන ලදී.

එහෙයින් මෙම සමථය සාධාරණ සහ යුක්ති සහගත වූත් එකක් බවට මම තීරණය කරමි.

**එච්. එම්. අනුලාවතී,**
බේරුම්කරු.

2022 ජනවාරි මස 02 වැනි දින.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.